# ත්‍රස්ත විරෝධී ජාතික සැලැස්ම

## ත්‍රස්තවාදය අවසන් කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක්

**පටුන**


1. ත්‍රස්ත විරෝධී ජාතික සැලැස්ම
2. ජාතියට යුද අරමුණක් !
3. රණ බිමට වැඩි වැඩියෙන් සෙබළ මුළු !
4. රණවිරුවන්ට වඩා හොඳ අවි ආයුධ !
5. කොටි ත්‍රස්තයාට එරෙහි ලෝක මතයක් !


## පෙරවදන

දෙමළ ජාතිවාදය විසින් මෙහෙයවනු ලබන ත්‍රස්තවාදය දැන් මුළු ශ්‍රී ලංකාවම ගිලගෙන ඇත. එහි අරමුණ පළමුව ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවා දෙවනුව මුළු ශ්‍රී ලංකාව අල්ලා ගැනීමයි. ඉන්පසුව දකුණු ආසියාවේ ලෝක ද්‍රවිඩ රාජ්‍යයක් ස්ථාපිත කිරීමය. මේ සඳහා ශ්‍රී ලංකාව තුළිත් ඉන්දියාව තුළත් නැගෙනහිර ආසියාව තුළත් බටහිර ලෝකය තුළත් මතවාදී, ප්‍රචාරක, උද්ඝෝෂණික මෙන්ම යුදමය ක්‍රියාවලියක් ද ගෙනයනු ලැබේ. මෙම ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම මුළු මහත් දේශයේ හා දකුණු ආසියාවේ ක්ෂණික හා තීරණාත්මක අවශ්‍යතාවය වී තිබේ. මේ නිසා දෙමළ ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව තුළත් ලෝකය තුළත් මතවාදී ලෙස, ප්‍රචාරක ලෙස, උද්ඝෝෂණික ලෙස, දේශපාලනික ලෙස හා යුදමය ලෙස සහමුලින්ම පැරදවීම ශ්‍රී ලංකාවට, දකුණු ආසියානු කලාපයට හා මුළු මහත් ලෝකයටම අයත් සාමයට ලැදි, ප්‍රජාතාන්ත්‍රික මිනිස් නිදහස අගයන සැමගේ මූලික අවශ්‍යතාව විය යුතුය. සියවස් ගණනක් පුරා විවිධ ආක්‍රමණ හමුවේ අනන්‍යතාවත්, ඉතිහාසයේ උරුමයත් රැකගත් ශ්‍රී ලංකාවේ අපි, දෙමළ ආක්‍රමණය අවසන් කිරීම සඳහා මූලික විය යුතු වෙමු. ඒ සඳහා මූලික අවශ්‍යතාව වන්නේ දෙමළ ජාතිවාදී කොටි ත්‍රස්තවාදීන් සමහුලින් අතු ගා දැමීම බව විශ්වාස කරන අපි ඒ සඳහා මේ සංයුක්ත වැඩ පිළිවෙල ජාතියට ඉදිරිපත් කරමු.

මෙය ප්‍රතිපත්ති මත පදනම් වූ සැලැස්මකි. එහෙත් මෙය යුද උපාය උපක්‍රම පිළිබඳ සැලැස්මක් නොවේ. මක්නිසාද යත් එවැනි උපාය උපක්‍රම පිළිබඳ සැලසුම් ප්‍රසිද්ධියේ සාකච්ඡා කොට ක්‍රියාත්මක කළ නොහැකි වන බැවිණි.

## ත්‍රස්ත විරෝධී ජාතික සැලැස්ම

කොටි ත්‍රස්තවාදයට හේතුව දෙමළ ජනතාවට සුවිශේෂ වූ ගැටලු තිබීමය යන්න අපි තරයේ ප්‍රතික්ෂේප කරමු. එමෙන්ම දෙමළ ජනතාව කොටි සංවිධානයට එකහෙළා උපකාර කරතියි යන මිථ්‍යාව ද අපි ප්‍රතික්ෂේප කරමු. කොටි සංවිධානය යැපෙන්නේ දෙමළ ජනතාව මත නොවේ. කොටි සංවිධානය දෙමළ ජනයාගෙන් වෙන් වී බොහෝ කල් පසු වී ඇත. එසේ හෙයින් දෙමළ ජනතාව දිනාගත හැකි එකම මග ෆෙඩරල් ව්‍යවස්ථා සංශෝධනය බවට වූ මිථ්‍යාව ද අපි ප්‍රතික්ෂේප කරමු. පසුගිය වසර

කිහිපය තුළ පීරු දේශය වැනි රටවල් ඔප්පු කර ඇත්තේ ත්‍රස්තවාදය අනුකම්පා විරහිතව මර්දනය කිරීමෙන් පමණක් ජනතාව හා ජාත්‍යන්තර ප්‍රජාව දිනාගත හැකි බවය. කොටි සංවිධානය සීමිත මෙහෙයුම්වලින් යුදමය ලෙස පරාජය කර ඉන්පසු ඔවුනට සීමිත බල බෙදුමට එකඟ කර ගත හැකිය යන මිථ්‍යාව ද අපි ප්‍රතික්ෂේප කරමු. සිංහල ජනයා ජාතිවාදීය යන්නද මිථ්‍යාවක් බව ද ප්‍රත්‍යක්ෂ ය. 1983 න් පසු දිගන් දිගටම එල්ල වූ සිංහල විරෝධී ජාතිවාදී ප්‍රහාර 127 ක් තුළ දී සිංහල ජනයා ප්‍රකෝප නොවී සිටීමෙන් ම මෙය ඔප්පු වී ඇත. එසේ හෙයින් ජාතික ධනය නාස්ති කරමින් සිංහල සමාජයට ජාතිවාදයෙන් මිදෙන ලෙස ඉල්ලන මාධ්‍ය ප්‍රචාර අද සේවය කරන්නේ කොටි ත්‍රස්තවාදය ශක්තිමත් කිරීම සඳහා ය

යුද්ධයට හේතුව කොටි ත්‍රස්තවාදයයි. කොටි ත්‍රස්තවාදයේ පදනම ම්ලේච්ඡත්වයය.එම ව්‍යාපාරය හැසිරෙන්නේ කොටි නායකයාගේ ම්ලේච්ඡ සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම් මතය. ඊට ශක්තිය ලැබී ඇත්තේ පාතාල ලෝකයෙනි. කොටි නායකයා පාතාල ලෝකයේ වීරයෙකි. මුදල් උපයන්නේ මත්ද්‍රව්‍ය හා ආයුධ ජාවාරමෙනි. සාමාන්‍ය දෙමළ ජනයාගෙන් බලහත්කාරයෙන් ලබාගන්නා කප්පම් වලිනි. රජයේ නොසැලකිල්ල නිසා හමුදාවලින් ද ආයුධ තොග ගණනින් ලබාගනී. ඒ සාමාන්‍ය සිංහල ජනතාවගේ මුදල්ය. ඊට අමතරව රජයේ විදේශ ප්‍රතිපත්තියේ අඩුපාඩුකම් හා අකර්‍යක්ෂමතාව නිසාද ත්‍රස්තවාදයට විදේශවලින් යම් යම් අවස්ථාවල යම් යම් අනුබල ලැබී තිබේ.

මේ නිසා කොටි ත්‍රස්තවාදයට එරෙහිව සිදුකරන යුද්ධය ජයග්‍රහණය කිරීම අනිවාර්යය වී ඇති අතර, ඒ සඳහා,

* සිංහල ජනතාව යුද්ධයට සෘජුව සම්බන්ධ කර ගැනීමත්
* රණවිරුවන් හට අභීතව සටන් කිරීම සඳහා ශක්තිමත් මතවාදයක් ගොඩනැගීමත්
* දූෂණයෙන් තොරව ජාතික ආර්ථිකය ශක්තිමත් වන පරිදි ආයුධ සම්පාදනය කර ගැනීමත්
* ඊළාම්වාදී මිථ්‍යාවෙන් දෙමළ ජනතාව මුදවා ගැනීමත් ක්ෂණික වගකීමක් වී තිබේ.

## ජාතියට යුද අරමුණක් !

යුද්ධයකදී තීරණාත්මක වන්නේ එකී සමාජයේ ජීවත්වන ජනතාවගේ සාමුහික මානසිකත්වයයි. එවැනි ජනතා රැකවරණයකින්, අරමුණකින් තොරව යුද්ධයට අවශ්‍ය ආර්ථික හා මතවාදීමය ශක්තිය ලබාගත නොහැකිය. එබැවින් යුද්ධයට ජනතාවගේ ශක්තිය ගොනු කර ගැනීම උදෙසා පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගත යුතුවේ.

1. යුද්ධයට අවශ්‍ය සහාය සේවාවන් සඳහා සෘජුව ම ජනතාව සහභාගි කරවා ගැනීම

   යුද්ධයට අවශ්‍ය මිනිස් සම්පත්, ද්‍රව්‍යමය සම්පත් ආදිය ලබාගැනීම සඳහා රාජ්‍ය ආයතනවල, පුද්ගලික ආයතනවල, වැඩපොළවල, අධ්‍යාපන ආයතනවල සහ ගම් හා නගරවල ත්‍රස්ත විරෝධී කමිටු පිහිටුවිය යුතුය. ඒවා ආරක්ෂක අංශ සමග සම්බන්ධීකරණය කිරීමෙන් ඔත්තු සේවා සහ ආරක්ෂක වැඩසටහන් ආදිය ද විධිමත් කළ හැකිය. මෙම කමිටු සඳහා දේශපාලන හෙංචයියන් පෙරටු,කර නොගත යුතුය.

2. කොටි සංවිධානය මැඩලීම පිණිස සියලු දේශපාලන පක්ෂ හා සංවිධාන ජාතික සන්ධානයකට පැමිණීම

එවැනි සන්ධානයක සාමාජිකයින් තෝරන විට එහි මූලික පරමාර්ථයන් පිළිබඳ පැහිදිල අවබෝධයක් සහ පූර්ණ අවධානයක් තිබිය යුතුය. කොටි සංවිධානයේ සහාය පෙරමුණ වන රාජ්‍ය නොවන සංවිධාන මගින් හෝ සුළු ජාතීන්ගේ බෙදුම්වාදයට දිරිදෙන වෙනත් විදේශ ආයතනවල මුදල් මගින් හෝ යැපෙන්නේ යැයි යන්තම් හෝ සැක කළ හැකි සියලු දේශපාලනඥයන් හා ආයතනයන් හට මෙවැනි සංවිධානයක සාමාජිකයින් වීමට ඉඩ නොදිය යුතුය.

3. පාසල් විෂය ධාරාව දේශාභිමානය වඩවන අයුරින් ප්‍රතිසංවිධානය කිරීම

බොරු ඊළාම්වාදී මිථ්‍යාමත සපුරා බැහැර කොට අපේ රටේ නිවැරදි ජාතික ඉතිහාසය සහ කොටි ත්‍රස්තවාදයේ කුරිරු ක්‍රියාකාරකම් පාසල් යන අවදියේ පටන් දරුවන්ගේ සිත් සතන් තුළ තහවුරු කළ යුතුය. මෙය වහාම සිදු කළ යුතු දෙයකි. එහි යහපත් ප්‍රතිඵල වසර දෙක තුනක් ඇතුළත නෙළා ගැනීමට හැකි වේ. මක්නිසාද යත් එවිට ජව සම්පන්න තරුණ පිරිසක් යුද්ධයට පෙරමුණ ගැනීම සඳහා සමාජයට එක්වන බැවිනි.

4. දේශාභිමානය හා සැබෑ ජාත්‍යාලය වැඩීම ඉලක්ක කොට ගත් කලා වැඩසටහන් දියත් කිරීම

අනවශ්‍ය උත්සව, සැණකෙළි, සංදර්ශන වහා නතර කළ යුතුය. සංගීතය, ටෙලි නාට්‍ය, චිත්‍රපට ආදී සාහිත්‍ය හා කලාව මාර්ගයෙන් කොටි ත්‍රස්තවාදයට එරෙහි වූ දැවැන්ත සැලසුම් සහගත වැඩසටහනක් දියත් කළ යුතුවේ.

5. සියලු මාධ්‍ය ආයතන හරහා කොටි විරෝධී අරගලයට අදාළ ප්‍රචාරක කටයුතු පමණක් දියත් කළ යුතුවේ.

දැනට සිදුවන්නේ එහි පරස්පරයයි. එනම් දැනට මාධ්‍ය මගින් ප්‍රචාරය කරන බොහොමයක් වැඩසටහන් හා ප්‍රවෘත්ති කොටි ත්‍රස්තවාදයට වාසිදායකය. සිංහල ජනතාවගේ යුද්ධය සඳහා ඇති අධිෂ්ඨානය මොට කිරීම සඳහා ම හේතු වේ. දුර්මුඛ කරන සුළුය. මෙය කණපිට හැරවීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා මාධ්‍ය මෙහෙය වීමට ජාතිය ගැන සැබෑ කැක්කුමක් ඇති පිරිසක් පත් කළ යුතුය. මාධ්‍යවලට අරක් ගෙන සිටින වසන්ත රාජලා සියල්ලෝම පන්නා දැමිය යුතුය.

6. කොටි සංවිධානය නීති විරෝධී කිරීමේ පනත වැඩිදුරටත් සංශෝධනය කර ඊට අනුබල දෙන සියලු පිරිස් කොටු කර ගැනීම

කොටි සංවිධානය වීරත්වයෙන් හුවා දක්වන ඔවුනගේ ප්‍රචාරක කටයුතු අනියම් මගින් සිදුකරන දෙන රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍ය ආයතන හා පුද්ගලයින්ට රාජ්‍ය ද්‍රෝහී චෝදනා යටතේ දැඩි දඬුවම් පැමිණවිය යුතුය. කොටි විරෝධී ප්‍රචාරක වැඩසටහන්වලට මෙන්ම ත්‍රිවිධ හමුදාව සහ පොලීසියට හට පිරිස් බඳවා ගැනීමේ ප්‍රචාරක වැඩසටහන්වලට ද පරස්පර විරෝධීවන සහ ඒවාට පහර ගහන, ඊනියා සම්මන්ත්‍රණ පවත්වන, පර්යේෂණ කෘති හා රූපවාහිනී වැඩසටහන් ඉදිරිපත් කරන රාජ්‍ය නොවන සංවිධාන වහාම තහනම් කළ යුතුය. තවද කොටි සංවිධානය තහනම් කිරීමේ නීති රීති මගින් මෙවැනි ප්‍රචාරක වැඩසටහන් ද ආවරණය වන සේ පුළුල් කළ යුතුය.

7. දකුණට සංක්‍රමණය වන දෙමළ ප්‍රජාවගේ ත්‍රස්ත විරෝධීභාවය සහතික කරගැනීම

දකුණට සංක්‍රමණය වූ දෙමළ සමාජය තුළ කොටි ත්‍රස්තවාදීන් සැඟවී සිටීම ජාතික ආරක්ෂාවට තර්ජනයකි. 1987 න් පසු කොළඹ, මහනුවර, මීගමුව, දෙහිවල, ගස්කිස්ස, කෝට්ටේ ආදී ප්‍රදේශවල සිදුවී ඇති දෙමළ සංක්‍රමණය පිළිබඳ තොරතුරු නිවැරදිව ලැයිස්තු ගත කළ යුතුය. ඔවුනට වෙනම අනන්‍යතා පත්‍රයක් නිකුත් කළ යුතුය. පවුලක සාමාජිකයෙකු ත්‍රස්ත ක්‍රියාවලට සම්බන්ධ වුවහොත් ඒ පිළිබඳ එකී පවුලම වගකිව යුතු අතර, ඒ පවුලවල වගකීම සාමුහික දෙමළ පුරවැසි සංවිධාන භාරගත යුතු පිළිවෙලක් සැකසිය යුතුය. නොඑසේ නම් දෙමළ ව්‍යාප්ත වාදය හරහා කොළඹ හා නුවර ත්‍රස්ත පිපිරීම් වැළැක්විය නොහැකි වනු ඇත.

8. දෙමළ ජනතාව ඉලක්ක කොටගත් විධිමත් අධ්‍යාපනික හා ප්‍රචාරක වැඩසටහනක් සැකසීම

ජාතිවාදී මිථ්‍යාවලින් හා ව්‍යාජ ඉතිහාස කතාවලින් මුලා කර ඇති දෙමළ සමාජයේ සමහර කොටස් ඉන් මුදා ගැනීම සඳහා දෙමළ ජාතිවාදය මේ සියවස තුළ දෙමළ සමාජයට කළ විනාශය දෙමළ ජනතාවට අධ්‍යාපනික හා ප්‍රචාරක ලෙස කාවැද්දිය යුතුය. මුහුණදීමට සිදු වී ඇති ප්‍රශ්න දෙමළ ජනතාවට විශේෂ වූ ප්‍රශ්න නොවන බවත් රට බෙදීම හරහා ඒවාට විසඳුම් නොලැබෙන බවත් ඔවුනට ඒත්තු ගැන්විය යුතුය.

9. දෙමළ සමාජයට හිරිහැරකාරී ලෙස කටයුතු කරන සියලුම දෙමළ සංවිධාන නීති විරෝධීකර නිරායුද කර අත්අඩංගුවට ගත යුතුය.

දැනට මධ්‍යස්ථ යැයි කියාගත් දෙමළ සන්නද්ධ කල්ලි කණ්ඩායම් රාශියක් ආයුධ රැගෙන සාමාන්‍ය ජනතාවට හිරිහැර කරති. ඔවුන් කිසිවෙක් ඊළාම් සටන් පාඨය මෙතෙක් අත්හැර නැත. ඔවුන් සියල්ලන් වහාම නිරායුධ කොට දෙමළ සමාජයට සාමය උදා කළ යුතුය.

10. කොටි ත්‍රස්තවාදයට හා බෙදුම්වාදයට එරෙහි දෙමළ සමාජ සංවිධානවලට හැකි උපරිම ලෙස උපකාර කිරීම

මෙය වහාම වතුකරයෙන් ආරම්භ කළ යුතුය. එමෙන්ම ශ්‍රී ලංකා රජයේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල හමුදාවල අධීක්ෂණය යටතේ පළාත් පාලන ආයතන මට්ටමින් සුභසාධන හා සංවර්ධන වැඩසටහන් වහා දියත් කළ යුතුය. ඒ සඳහා සාමාන්‍ය දෙමළ ජනයා හවුල් කර ගැනීමත් ඔවුන්ට රැකවරණය ලබාදීමත් කළ යුතුය.

11. මුස්ලිම් ජනයා බෙදුම්වාදයෙන් මුදවා ගැනීම සඳහා වැඩසටහන් දියත් කිරීම

දෙමළ කොටි ත්‍රස්තවාදීන් හා දෙමළ ජාතිවාදයෙන් සිදු වී ඇති ව්‍යසනය පෙන්වා දෙන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතුය. මුස්ලිම් බෙදුම්වාදීන් නීති විරෝධී කළ යුතුය. මුස්ලිම් ජනයා අතර සාම යට ලැදි කොටස් කොටි විරෝධී අරගලයට සක්‍රීයව සම්බන්ධ කරගත යුතුය.

## රණබිමට වැඩි වැඩියෙන් සෙබළ මුළු !

ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශවලට කොටි ත්‍රස්තවාදයට මුහුණ දීම සඳහා නොහැකියාවක් පවතින බව නිරත වාර්තා වේ. එහෙයින් පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස යෝජනා කරනු ලැබේ.

1. යුද්ධය සඳහා යුද න්‍යාය පත්‍රයක් සැපයීම

   යුද මෙහෙයුම් සඳහා දේශපාලන නායකත්වය අත්‍යවශ්‍ය නමුදු දේශපාලන න්‍යාය පත්‍රය අනුව යුද මෙහෙයුම් සිදු නොවන ලෙස ස්වාධීන තීරණ ගැනීමේ හැකියාවක් ආරක්ෂක අංශවලට ලබාදිය යුතුය.

   ධෛර්යය ද බිඳ ඔවුන් හමුදාව හැරයාමට පොළඹවයි. ඒවා කොටි සංවිධානයේ පෙරමුණු සංවිධාන දැයි සිතනා තරම් රාජ්‍ය ද්‍රෝහී වී ඇත. සුදු නෙළුම් හා ජනවාර්ගික අමාත්‍යාංශයේ ප්‍රචාරක කටයුතු වහාම නතර කළ යුතු අතර, රාජ්‍ය නොවන සංවිධානවල ජාති ද්‍රෝහී ප්‍රචාරක කටයුතු නීති විරෝධී කළ යුතුය.

4. බැඳෙන සෑම යුද සෙබළෙකුටම යුද පුහුණුවට අමතරව අධ්‍යාපනික වැඩසටහනක් ද ලබාදිය යුතුය. එහිදී,

   (අ)අපේ රටේ ජාතික ඉතිහාසය හා ඒ තුළ පරසතුරු ආක්‍රමණ අපේ මුතුන් මිත්තක් පරාජය කළ අයුරු

   (ආ) දෙමළ ජාතිවාදයේ විකාශය හා දෙමළ ත්‍රස්තවාදය වර්ධනය වූ අයුරු

   (ඇ) ලෝකයේ ත්‍රස්තවාදී බලවේග මැඩපැවැත්වීමේ අත්දැකීම්

   (ඈ) කොටි සංවිධානය හා එහි උපාය උපක්‍රම

   (ඉ) භාෂා දැනුම (විශේෂයෙන් සරළ දෙමළ භාෂා දැනුම) යන කාරණාවලට ප්‍රමුඛතාව දිය යුතුය.

එමගින් සෙබළා සටන් කළ යුත්තේ ඇයි ද යන්න පිළිබඳව ඔහුට මතයක් ඇතිවනු ඇත. මේ පාඨමාලා ආරක්ෂක අංශවල ඉහළ නිලධාරීන් සඳහා ඉහළ මට්ටමකින් පැවැත්විය යුතුය.

5. ආරක්ෂක අංශවලට විශේෂ පුහුණුවක් ලබාදීම

   ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශවල ත්‍රස්තවාදය මැඩලීම සඳහා විශේෂ පුහුණුවක් ලද අය සිටින්නේ 10% ක් පමණ ප්‍රමාණයකි. එම නිසා ත්‍රස්තවාදය මැඩීම පිණිස විශේෂ පුහුණුවක් ලත් පිරිස, ආරක්ෂක හමුදාවල ප්‍රතිශතයෙන් 50% ක් වත් අවම වශයෙන් විය යුතු බව ද යෝජනා කරමු. මේ මගින් ආරක්ෂක අංශවල ගුණාත්මක අගය ඉහළ නැංවිය හැකිය. තවද දැනට පුහුණුව ලත් අයගෙන් බහුතරය සිටින්නේ යුද පෙරමුණේ නොව මැති ඇමති ආරක්ෂක අංශවලය. එහෙත් පාර්ලිමේන්තු නියෝජිතයන් හා මැති ඇමතිවරුන්ගෙන් විශේෂ ආරක්ෂාව අවශ්‍ය කීප දෙනෙකුට පමණි. මේ නිසා මැති ඇමති ආරක්ෂාව 50% කින් අඩු කරන ලෙස ද අපි යෝජනා කරමු.

6. නව සෙබළුන් බඳවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල, පාසල් හා තරුණ සංවිධාන ඉලක්ක කරගත් පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

ඒ සඳහා ජාතිය මුහුණ දී ඇති අනතුර හා තරුණයින්ගේ ජාතික වගකීම පෙන්වා දෙන පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතුය. ත්‍රිවිධ හමුදාවට වැඩි වැඩියෙන් පිරිස් බඳවාගැනීම ඉලක්ක කොටගෙනම මෙවැනි වැඩසටහන් දියත් කළ යුතුය.

තවද රටේ සැබෑ ජාතික ඉතිහාසය දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදය පසුගිය දශක දෙක තුළ මේ රට තුළ අපරාධ හා දේපොළ විනාශයන් බෞද්ධ සිද්ධස්ථාන වැනසීම් ආදිය පදනම් කොටගත් ප්‍රචාරක ව්‍යාපාරයක් විශ්වවිද්‍යාල කාර්මික විද්‍යාල පාසල් හා ගම්මානවල ප්‍රදර්ශනය කර තරුණයින් ජාතික කාර්යයට කැඳවිය යුතුය.

7. සිවිල් ආරක්ෂක කටයුතු සඳහා නව ආරක්ෂක බලකායක් පිහිටුවීම

ආරක්ෂක හමුදාවල විශේෂ පිරිසක් යුද පෙරමුණේ නොවන සෝදිසි කිරීම් ආදී සිවිල් ආරක්ෂක කටයුතුවල යෙදී ඇත. මෙය ජාතික අපරාධයකි. මේ නිසා වහාම යුද පෙරමුණ නොවන සියලු සිවිල් ආරක්ෂක කටයුතු විශේෂයෙන් නිර්මාපිත ආයතනයකට භාර දී ඒ සෙබළ පිරිස් යුද පෙරමුණට යැවිය යුතුය.

(අ)ආරක්ෂක අමාත්‍යාංශයට අනුයුක්තව මෙම ආයතනය ස්ථාපිත කළ යුතුය. මෙම ආයතනයට බට පිරිස් බඳවා ගැනීමේදී, යුද බිමට යෑමට අනවශ්‍ය බව ද, ඔවුනගේ රාජකාරිය වනුයේ මාර්ග බාධක පරීක්ෂා කිරීම, උතුර හා නැගෙනහිරින් බැහැර ප්‍රදේශවල මහජන සිවිල් ආරක්ෂාව හා රාජ්‍ය උත්සවවලට ආරක්ෂාව සැපයීම යනාදිය මත පමණක් පදනම් විය යුතුය. මෙවැනි පදනමක් මත පිරිස් බඳවා ගැනීම ඉතා පහසු වනු ඇත. සියුම් ප්ලාස්ටික් පුපුරන ද්‍රව්‍ය, පුද්ගලයින් හැසිරෙන ආකාරයෙන් ත්‍රස්තවාදීන් හඳුනාගැනීමේ ක්‍රම, සැහැල්ලු ආයුධ භාවිතය හා ස්ථානෝචිතව ක්‍රියා කිරීමේ හැකියාව පිළිබඳ පුහුණුවක් ලබාදිය යුතුය.

(ආ)පොලීසිය ආශ්‍රිත සිවිල් ආරක්ෂක කමිටු, පාසල්වල කෙඩෙට් කණ්ඩායම්, දේශප්‍රේමී පුරවැසි කමිටු ආදියට තවත් ආරක්ෂක වගකීම් ප්‍රමාණයක් මුදාහළ හැකිය.

(ඇ)අර්ධ යුදමය වන ජාතික ආරක්ෂක සහායක බල ඇණියක් සිවිල් ආරක්ෂක කටයුතු සඳහා සෑම රජයේ හා පුද්ගලික ආයතනයකම පිහිටුවිය යුතුය. මේ සඳහා විශ්‍රාමික යුද භටයින්ගේ සේවය ද ලබාගත හැකිය.

8. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල යුදමය ලෙස වැදගත් සියලු ගම්මාන හා ප්‍රදේශ ආවරණය වන ලෙස හමුදාමය හා අර්ධ හමුදාමය සාමුහික ගම්මාන සීයක් පිහිටුවීම.

දෙමළ අන්තවාදීන් විසින් නැගෙනහිර ප්‍රදේශයෙන් පළවා හරින ලද සියලු ජනකොටස් ඔවුනොවුන්ගේ ම ගම්වල එම සංඛ්‍යාවම නැවත පදිංචි කළ යුතුය. සිංහල, දෙමළ හා මුස්ලිම් යන ජන කොටස් තුනම නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා රජයේ පුනරුත්ථාපන මුදල් සාධාරණ ලෙස වැය කිරීමට රජය වග බලාගත යුතුය. මෙම කාර්යය ඉටු කිරීම සඳහා නැගෙනහිර ප්‍රදේශයෙන් අස්ථාන ගත වූ සියලු ජනකොටස් වහාම ලියාපදිංචි කිරීමේ

ක්‍රියාවලියක් දියත් කළ යුතුය. යුද්ධයේ ප්‍රාදේශීය වගකීම් සෘජුවම ඔවුනට ලබාදිය යුතුය. එමගින් සෙබළුන්ට ඇති පුද්ගලික හා සාමාජයීය පීඩනයන් දුරු වී තම සාමුහික ගම්මානය වෙනුවෙන් සටන් කිරීමේ පවුල් හා දේශප්‍රේමී හැඟීමක් ඇති වේ.

කැමති නිත්‍ය යුද හමුදා සෙබළුන්ට ද ඒ ප්‍රදේශවල ඉඩම් ලබාදිය යුතුය. දෙමළ හා මුස්ලිම් ජාතිවාදී සංවිධාන හා දේශපාලන පක්ෂ මගින් නොකඩවා කරගෙන යන ජනවාර්ගික පවිත්‍රකරණය වහාම නැවැත්විය යුතුය. කිසියම් දෙමළ පක්ෂයක් හෝ සංවිධානයක් උතුරු හා නැගෙනහිර ප්‍රදේශ දෙමළ නිජබිමය යන මිථ්‍යාව මත එරෙහි වේ නම් ඔවුන් රාජ්‍ය ද්‍රෝහීන් ලෙස සලකා දඬුවම් කළ යුතුය.

## රණවිරුවන්ට වාඩා හොඳ අවි ආයුධ !

නවීන අවි මෙන්ම පවතින අවි මහා පරිමාණයෙන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවලට අවශ්‍ය වේ.
එහෙයින්,

1. ආයුධ නිපදවීම

සැහැල්ලු අවි, බර අවි, පතුරම්, මෝටාර් හා මෝටාර් විදිනක, යුද රථ, හෙලිකෝපටර්, නාවික යාත්‍රා ආදිය මහා පරිමාණයෙන් නිෂ්පාදනය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ අවි නිෂ්පාදනාගාරයක් සහිත ආරක්ෂක සංකීර්ණයක් පිහිටුවිය යුතුය. මෙය වෙසෙසින්ම රාජ්‍ය ආයතනයක් විය යුතු අතර, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වැනි ආයතන කෙළින්ම මේ සඳහා යොදාගත හැකිය. මෙමගින් විදේශවලට ඇදී යන මුදල් ඉතිරිවනවා පමණක් නොව රැකියා අවස්ථා බිහිවීමත් සිදු වේ. අනාගත ශ්‍රී ලංකාවේ යුද අවි අවශ්‍යතා සහමුලින් ම සපුරා ගැනීම ඉලක්ක කරගෙන අදියර කිහිපයකින් මෙය වහා ආරම්භ කළ යුතුය.

2. අවි ආයුධ පිළිබඳ තොරතුරු පර්යේෂණ මධ්‍යස්ථානයක් ගොඩනැගීම

නවීන අවි පිළිබඳ තොරතුරු පර්යේෂණ මධ්‍යස්ථානයක් ගොඩනැගීම

නවීන අවි පිළිබඳව තොරතුරු රැස් කිරීම, පර්යේෂණ කිරීම හා අවි සැලසුම් කිරීම සඳහා වූ අවි ආයුධ පිළිබඳ පර්යේෂණ ආයතනයක් ආරක්ෂක අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල සම්බන්ධ කරගෙන පිහිටුවිය යුතුය.

3. අවි ගනුදෙනු විධිමත් කිරීම

විදේශ සමග සිදුකරන අවි ගනුදෙනු විදේශ රාජ්‍ය සමග ශ්‍රී ලංකා රජය හා ආරක්ෂක අමාත්‍යාංශය මගින් පමණක් සිදු කළ යුතුය. සියලු ගනුදෙනු ජාතික සංධානයට හෙළි කළ යුතු අතර, සතුරන් අතට අවි ලබාදෙන කොමිස් මුදල් උපයන අතරමැදියෙකු හෝ කවරෙකු හෝ වෙත්නම් ඔවුනට එරෙහිව රාජ්‍ය ද්‍රෝහී චෝදනා යටතේ දඬුවම් පැමිණවිය යුතුය.

## කොටි ත්‍රස්තයන්ට එරෙහි ලෝක මතයක් !

කොටි සංවිධානයේ සංවිධාන ජාලය ලාංකික දෙමළ සමාජය නොව ජාත්‍යන්තර ආයතන පදනම් කරගත් එකකි. ඔවුනට අරමුදල්, ප්‍රචාරක සේවාවන් හා අවි ආයුධ ලැබෙන්නේ මේ ජාත්‍යන්තර ජාලය හරහාය. මේ නිසා පහත සඳහන් ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු වේ.

1. ඉන්දීය මධ්‍යම ආණ්ඩුව සමග ගොඩබිම, මුහුදු හා අහසින් කෙරෙන ත්‍රස්තවාදී ප්‍රවාහන කටයුතු වැළැක්වීමේ ආරක්ෂක ගිවිසුමක් ඇති කරගෙන ක්‍රියාත්මක කළ යුතුය.

2. එකම ආර්‍ය ජනතාවකගෙන් පැවත එන උත්තර ඉන්දිය හා සිංහල ජනයාගේ අතීත සබඳතා අශෝක යුගයේ මෙන් ශක්තිමත් කරගත යුතුය. ද්‍රවිඩස්ථානයක් පිහිටුවීම ඉන්දිය ජාතික ආරක්ෂාවට ඇති ප්‍රබලතම තර්ජනය බව පෙන්වා දිය යුතුය.

3. ඉන්දියාව, නේපාලය, භූතානය හා බංගලිදේශයේ වසන බෞද්ධ ජනයා ඉලක්ක කරගෙන කොටින්ගේ බෞද්ධ විරෝධී ක්‍රියා පිළිවෙත් හෙළිදරව් කරන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතුය.

4. බුරුමය, කම්පුචියාව, තායිලන්තය, තායිවානය වැනි බෞද්ධ රටවල් කොටින්ගේ අවි ආයුධ ජාවාරම්වල කේන්ද්‍රයන් වී ඇති නිසා එකී රටවල රාජ්‍ය නායකත්වය, භික්ෂු නායකත්වය හා බෞද්ධ සමාජය ඉලක්ක කරගත් කොටින්ගේ බෞද්ධ විරෝධී ක්‍රියා හෙළිදරව් වන ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතුය.

5. පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය වැනි රටවල් කොටින්ගේ අවි ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම්වලට යොදාගන්නා නිසා ඒ රටවල් ඉලක්ක කරගෙන කොටින්ගේ මුස්ලිම් විරෝධී ප්‍රහාර පිළිබඳ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතුය.

6. උතුරු ඇමෙරිකාව, යුරෝපය හා ඕස්ට්‍රේලියාවේ වෙසෙන ලක්ෂ සංඛ්‍යාත සිංහල ජනයා කොටි විරෝධී ප්‍රචාරක ක්‍රියාවලියකට හා යුද වියදම්වලට දායක කර ගැනීමේ වැඩසටහනකට සක්‍රීය ලෙස යොදාගත යුතුය.

7. එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, ප්‍රංශය වැනි ලෝක බලවතුන්ගේ ත්‍රස්තවාදයට එරෙහිව ලබාගත හැකි උපරිම දේශපාලන හා යුද සහාය රටේ ස්වෛරීත්වය හෑල්ලු නොකොට ලබාගත යුතුය. දැන් මේ රටවල නිල මතය යූ දෙමළ ජනයාට දුක්ගැනිවිල ඇතය යන්න පිළිබඳ සත්‍ය තත්වය අවබෝධ කළ යුතුය. කොටින්ගේ බලවත්වීම ලෝකයේ ම ත්‍රස්ත කල්ලිවලට පැතිර යෑමේ අනතුර පිළිබඳව ද ඔවුන් දැනුවත් කළ යුතුය.

8. අවශ්‍ය නම් කොටි සංවිධානයට එරෙහිව විදේශවලදී ද යුද මෙහෙයුම් දියත් කළ යුතුය.

## පසුවදන

බලයේ සිටින්නේ කවර දේශපාලකයෙක් වුව ද කොටි ත්‍රස්තවාදය සැබෑ ලෙස ම පරාජය කිරීමට නම් මෙහි සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. කොටි ත්‍රස්තවාදය වැනසීමට හා රටට සාමය උදාකර ගැනීමට ඒ මග හැර අන් මගක් නැති බව අපි තරයේ ම විශ්වාස කරමු. ඒ සඳහා ඊනියා සාම සාකච්ඡා, ඊනියා දේශපාලන විසඳුම් වැනි අත් හදා බලා වැඩි වැඩියෙන් විනාශකාරී බව ඔප්පු වී ඇති ක්‍රියාමාර්ග ඉවත ලා මේ අරහයා මෙතෙක් කිසිදු අවධානයක් යොමු නොවූ මෙම ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කරන ලෙසට බලකර සිටිමු.

මෙයට අමතරව දීර්ඝ කාලීන සමාජ ස්ථාවරත්වයක් සඳහා දෙමළ ජාතිවාදය මතවාදී ලෙසත් උද්ඝෝෂණික ලෙසත් දේශපාලනික ලෙසත් යුදමය ලෙසත් සහමුලින් අවසන් කළ යුතු බව ද අවධාරණය කරමු.

කෙතරම් වේදනාකාරී වුවත් කවර වන්දියක් ගෙවීමට සිදු වුවත් මේ මග හැර අන් මගක් ජාතියට ඉතිරිව නැත.

දෙමළ ජාතිවාදය විසින් මෙහෙයවනු ලබන ත්‍රස්තවාදය දැන් මුළු ශ්‍රී ලංකාවම ගිලගෙන ඇත. මෙම ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම මුළු මහත් දේශයේ හා දකුණු ආසියාවේ ක්ෂණික හා තීරණාත්මක අවශ්‍යතාව වී තිබේ. මේ නිසා දෙමළ ත්‍රස්තවාදය ශ්‍රී ලංකාව තුළත් ලෝකය තුළත් මතවාදී ලෙස ප්‍රචාරක ලෙස, උද්ඝෝෂණික ලෙස, දේශපාලනික ලෙස හා යුදමය ලෙස සහමුලින්ම පැරදවීම ශ්‍රී ලංකාවට, දකුණු ආසියානු කලාපයට හා මුළු මහත් ලෝකයටම අයත් සාමයට ලැදි, ප්‍රජාතාන්ත්‍රික මිනිස් නිදහස අගයන සැමගේ මූලික අවශ්‍යතාව විය යුතුය.

සියවස් ගණනක් පුරා විවිධ ආක්‍රමණ හමුවේ අනන්‍යතාවත්, ඉතිහාසයේ උරුමයත් රැකගත් ශ්‍රී ලංකාවේ අපි, දෙමළ ආක්‍රමණය අවසන් කිරීම සඳහා මූලික විය යුතු වෙමු. ඒ සඳහා මූලික අවශ්‍යතාව වන්නේ දෙමළ ජාතිවාදී කොටි ත්‍රස්තවාදීන් සහමුලින් අතුගා දැමීම බව විශ්වාස කරන අපි ඒ සඳහා මේ සංයුක්ත වැඩපිළිවෙල ජාතියට ඉදිරිපත් කරමු.